ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date. 2023/03/09

| | | |
|---|---|---|
| පැමිණිලි පාර්ශවය | :- 01. | D.V ලක්ෂ්මන් ගුණසේකර මහතා, |
| | 02. | D.V අජිත් ගුණසේකර මහතා,<br>40/A බන්ට් පාර,<br>ඉහිණියාගල. |
| වගඋත්තරකාර පාර්ශවය | :- 01. | පො.ප. - පී. එන්. බී. මහගෙදරගම මහතා,<br>ස්ථානාධිපති,<br>පොලිස් ස්ථානය,<br>ඉහිණියාගල. |
| | 02. | උ.පො.ප සුමනරත්න මහතා,<br>පොලිස් ස්ථානය, ඉහිණියාගල. |
| | 03. | පො.සැ 31362 තිලකරත්න මහතා,<br>පොලිස් ස්ථානය, ඉහිණියාගල |
| | 04. | පො.සැ 12882 ගුණවර්ධන මහතා,<br>පොලිස් ස්ථානය, ඉහිණියාගල |
| | 05. | පො.සැ 26196 පතිරණ මහතා,<br>පොලිස් ස්ථානය, ඉහිණියාගල |

<u>පැමිණිලි අංකය :-</u> **<u>HRC/AM/22/14/B/EM</u>**

ඉහත පැමිණිලිකාර ලක්ෂ්මන් ගුණසේකර යන අය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, 2014.03.03 වන දින ඉහිණියාගල පොලිස් ස්ථානයේ



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman } 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax } 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail } sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி } 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் } 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு } 1996
වෙබ් / இணையம் } www.hrcsl.lk

පො.සැ 26196 පතිරණ මහතා සහ තවත් නිලධාරියෙකු විසින් තම සහෝදරයා වන ඩී.වී අජිත් ගුණසේකර යන අයව අත්අඩංගුවට ගෙන 2014.03.05 දින ප.ව 12.00 දක්වාම අධිකරණයට ඉදිරිපත් කිරීමකින් තොරව රඳවා තබා ගත් බවට සඳහන් කර ඇත.

මෙම පැමිණිල්ල පැමිණිලිකරු විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් පසු එදිනම එනම්, 2014.03.05 වන දින පැය 12.20 පමණ කොමිෂන් සභාව විසින් අදාළ සැකකරුවන් සම්බන්ධයෙන් පොලිස් ස්ථානය වෙතින් විමසා සිට ඇති අතර, එහි කාර්යයභාර නිලධාරී කා.පො.සැ 3599 රත්නායක නිලධාරිණිය විසින් ඒ සඳහා පිළිතුරු ලබා දෙමින් "එවැනි කිසිවෙකුත් අත්අඩංගුවේ පසු නොවන බවට" දන්වා ඇත. ඉන් විනාඩි 05 කට පමණ පසුව ස්ථානාධිපති විසින් මානව හිමිකම් කොමිෂන් සභාව අම්පාර ප්‍රාදේශිය කාර්යාලයේ සම්බන්ධීකරණ නිලධාරී වෙත ඇමතුමක් ලබා දෙමින් සැකකරුවන් තම අත්අඩංගුවේ සිටින බවත්, එදින අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන බවත් දන්වා ඇත. 2014.03.07 දින වන විට බන්ධනාගාර ගතව සිටි ඉහත ඩී.වී අජිත් ගුණසේකර යන අයව හා එච්.චන්දන කුමාර යන අයව අම්පාර රෝහලේ දී කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් පරීක්ෂාවට ලක් කර ඇති අතර , එහිදී ඔවුන්ගේ වම් කකුල් වල පිට පතුලේ ඉදිමුම් ලකුණු දක්නට ලැබී ඇත. එම අය විසින් ලබා දී ඇති ප්‍රකාශයන්හි දි තම අත් ගැට ගසා ඇඳක ඉදිරියෙහි විට්ටම් අතරින් කකුල් එළියට දමා යටි පතුල් වලට පහර දුන් බවට හා රත්මල්ගහඇල්ල පොලිස් මුරපොළ හි දී අදාළ පහරදීම සිදු කරන ලද බවටත්, පසුව කටඋත්තර ලබා ගෙන එය තමන්ට නොපෙන්වා අත්සන් ලබා ගත් බවටත් සඳහන් කර ඇත.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

මෙම පැමිණිල්ලට අදාළව ලිඛිත කරුණු ඉදිරිපත් කරමින් වගඋත්තර පාර්ශවය සඳහන් කර ඇත්තේ, ඩී.වී අජිත් ගුණසේකර යන අය හා එච්. චන්දන කුමාර යන අය 2014.03.06 වන දින පැය 18.40 ට හා 18.55 ට සොරකමක් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන 2014.03.06 වන දින අධිකරණය වෙත ඉදිරිපත් කළ බවයි. අදාළ අත්අඩංගුවට ගැනීම සිදුකරන ලද්දේ උ.පො.ප සුමනරත්න, පො.සැ 12882 ගුණවර්ධන, පො.සැ. 26196 පතිරණ යන නිලධාරීන් වන බවද සඳහන් කර ඇත.

උ.පො.ප සුමනරත්න , පො.සැ 26196 පතිරණ , පො.සැ 12802 ගුණවර්ධන යන නිලධාරීන්, 2014.02.17 ස්ථානයට වාර්තා වී තිබූ බල අපරාධ අංක 8/2014 හි අදාළ ඉගිණියාගල සේනානායක සමුද්‍රයේ පිටත දොරටු විවෘත කිරීමට විදුලිය සපයා තිබූ රු.3,211,640.00 ක් වටිනා විදුලි රැහැන් (තඹ කම්බි) සොරකම් කිරීමේ සිද්ධිය විමර්ශනයේදී ධම්මික හා ආර්.එල් ආනන්ද යන අය 2014.03.05 පැය 15:15 ට අත්අඩංගුවට ගෙන ඔවුන්ගෙන් ලත් තොරතුරු මත පැය 18.40 ට ඩී.වී අජිත් ගුණසේකරත්, පැය 18.55 ට එච්. චන්දන කුමාරත් ස්පිල් පාරේදී අත්අඩංගුවට ගත් බවට සඳහන් වේ. ඔවුන් අත්අඩංගුවට

ගැනීමට යාමේදී අලි වැට අයින දිගේ වතුර ගලා යන ස්පීල් එක දෙසට ගල් උඩින් දිව යන අවස්ථාවේදී ඇද වැටුණු බවත්, තමන් මහත් පරිශ්‍රමයක් දරා ඔවුන් අත්අඩංගුවට ගත් බවත්, ඔවුන් ස්ථානයට ඉදිරිපත් කර ප්‍රකාශ ලබා ගැනීමෙන් පසු ප්‍රතිකාර අවශ්‍යද යන්න විමසා සිටි බවත්, ඔවුන් ප්‍රතිකාර අවශ්‍ය නොමැති බව සඳහන් කළ බවත් පවසා ඇත. එසේම තමන් කිසිදු අවස්ථාවක ඔවුන්ට පහරදීමක් සිදු නොකළ බවද දන්වා ඇත.

සිද්ධියට අදාළ පොලිස් උධෘත වලද ඉහත කරුණුම සඳහන් කර ඇත. සැකකරුවන් අත්අඩංගුවට ගත් බවට චෝදනා ලද පො.සැ තිලකරත්න 31362 ප්‍රකාශයක් ලබා දෙමින් තමන් 2014.03.05 වන දින වැටලීම් රාජකාරී සඳහා ගොස් පොලිස් ස්ථානයට පැමිණියේ රාත්‍රී 7.00-7.30 ට පමණ බවත්, ඒ වන විට පොලිස් ස්ථානයේ සිර මැදිරියේ අදාළ සැකකරුවන් රඳවා සිටිනු දුටු බවත්, තමන්ද එම ගම් ප්‍රදේශයේම බැවින් ඔවුන් හඳුනන බවත්, පහර දීම් හා අත්අඩංගුවට ගැනීම් තමා විසින් සිදු කළ බවට ඔවුන් කරන චෝදනා ප්‍රතික්ෂේප කරන බවත් සඳහන් කර ඇත. මෙයට පෙර යතුරු පැදියක පැති කණ්නාඩි සොරකම් කිරීමක් සම්බන්ධව මොවුන් අත්අඩංගුවට ගැනීමට සහය වීම නිසා තමන් සමඟ අමනාපයෙන් මෙවැනි චෝදනා නඟා ඇතැයි තමන් සිතන බවද වැඩි දුරටත් සඳහන් කර ඇත.

**වෛද්‍යමය සාක්ෂි :-**

**දෙනිපිට විදානගේ අජිත් ගුණසේකර යන අයට අයත් වෛද්‍ය වාර්තා :-**

දෙනිපිටිය විදානලාගේ අජිත් ගුණසේකර යන අය 2014.03.06 වන දින ඉඟිණියාගල රෝහලේ වෛද්‍යවරයා වෙත අධිකරණ වෛද්‍ය පෝරම 49/2014 යටතේ ඉදිරිපත් කර ඇති අතර, උක්ත පරීක්ෂණ පෝරමයේ 10 යටතේ තුවාල තාඩිත ලෙසත් , 12 යටතේ රිදවීමේ ගණය මොට්ට ලෙසත්, බරපතල නොවන යන කොටුත් ලකුණු කර ඇති බව නිරීක්ෂණය වේ.

එසේම මෙම පැමිණිලිකරු 2014.03.07 වන දින අම්පාර මහ රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරී වෙත යොමු කර ඇති අතර, එහිදී රෝගියා වෛද්‍යවරයා වෙත" 2014.03.03 වන දින ඉඟිණියාගල පොලිසියේ නිලධාරීන් ලී පොල්ලකින් වම් යටි පතුල් වලට පහරදීමක් සිදු කර ඇති බව" දන්වා ඇති බව සඳහන්ව ඇත. රෝගියා වෙත සිදුව ඇති තුවාල හා එහි ස්වභාව යටතේ යටි පතුලේ වම් පස 2cm x 3cm තරම් වූ තැලීමක් පවතින බව දන්වා ඇත. එනම් එය, There is medical evidence of blunt force trauma to left side foot යනුවෙන් සඳහන් කර ඇත.

**හක්මනගේ චන්දන කුමාරට අයත් වෛද්‍ය වාර්තාව :-**

හක්මනගේ චන්දන කුමාර යන අය 2014.03.06 වන දින ඉඟිණියාගල රෝහලේ වෛද්‍යවරයා වෙත ඉඟිණියාගල පොලිසිය විසින් අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරම 50/2014 යටතේ ඉදිරිපත් කර ඇත. එහිදී වෛද්‍යවරයා අංක 10 යටතේ තුවාල තාඩිත යන්න ලකුණු කර ඇති අතරෙ, අංක 12 යටතේ රිදවීමේ ගණය මොට්ට ලෙසත්, බරපතල නොවන යන කොටු ලකුණු කර ඇත.

අදාළ පැමිණිලිකරු 2013.03.07 වන දින අම්පාර අධිකරණ අධිකරණ වෛද්‍ය නිලධාරී වෙත යොමු කර ඇත. එහිදී රෝගියා විසින් වෛද්‍යවරයා වෙත ලබා දී ඇති රෝග ඉතිහාසය මඟින් දක්වා ඇත්තේ, ඉඟිණියාගල පොලිස් නිලධාරීන් විසින් සොරකමක් සම්බන්ධව 2014.03.03 වන දින අත්අඩංගුවට ගෙන කකුල් වලට හා පිටුපස ප්‍රදේශයට පහර දුන් බවයි. රෝගියා වෙත සිදුව ඇති තුවාල හා එහි ස්වභාවය යටතේ රෝගියාගේ

වම් මැණික්කටුව මත ඇතුල් පැත්තට වන්න 1cm X 1/2 cm තරම් වූ රේඛීය සීරීමක්,

වම් දණහිස සංධියට අගල් 4 ක් ඉහළින් වම් කළවා පිටුපස 2cm x 2cm ප්‍රමාණයේ තැලීමක්,

වම් දණහිස් සංධියට අඟල් 11 ක් පමණ ඉහළින් වම් කළවේ 1x 2cm තැල්මක් සහ

වලලුකර සන්ධියේ සිට අගල් 06 ක් පහලින් වම් යටි පතුලේ 2cm x 3cm තරම් වූ තැල්මක් පවතින බවට දක්වා ඇත.

තුවාල සිදුව ඇති ආකාරය මොට ආයුධ ලෙසත්, බරපතල නොවන බවත් දක්වා ඇත. වැඩිදුර සටහන් යටතේ There is medical evidence of blunt force trauma to left wrist, left foot and thigh දක්වා ඇත.

**පුද්ගල සාක්ෂි :-**

ආර්.ඒ පුෂ්පා කාන්ති යන අය විසින් කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, තම පුතා වන ඩී.වී අජිත් ගුණසේකර යන අය 2014.03.03 වන දින සවස 2.30 ට ඉඟිණියාගල පොලිස් ස්ථානයේ පො.සැ පතිරණ හා පො.සැ ගුණවර්ධන යන අය විසින් අත්අඩංගුවට ගත් බවට තම පුතාගේ මිතුරෙකු වන නිමල් කැටවත්ත යන අයගෙන් දැනගැනීමෙන් පසු පොලිස් ස්ථානයට ගියද දින 2ක් යනතුරු ඔහු පෙන්වීමට කටයුතු නොකළ බවයි.

නිමල් කැටවත්ත යන අය විසින් කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, 2014.03.03 වන දින තම මිතුරා වන අජිත් ගුණසේකර සමඟ වැවට යාම සඳහා තම යතුරුපැදියෙන් ගමන් කරමින් සිටියදී ප.ව 2.30 ත් 2.45 අතර කාලයේදී පතිරණ සාජන් මහතා සහ තවත් නිලධාරියෙකු විසින් යතුරුපැදිය නවතා අජිත් යන අයව ඉඟිණියාගල පොලිස් ස්ථානාධිපතිතුමා හමුවීම සඳහා රැගෙන යා යුතු බවට දන්වා ස්ථානාධිපතිවරයාගේ නිල නිවස වෙත රැගෙන යන ලද බවයි. පසුව තමාගේ යතුරුපැදියද ඔවුන් විසින් ලබා ගෙන තමාට නැවත නිවසට යන ලෙසට දන්වන ලද බවත්, එම අවස්ථාවේදී අජිත් යන අයව රැගෙන ඒමට හේතුව කුමක්දැයි තමා විසින් විමසන ලද බවත්, ප්‍රකාශයක් ලබා ගැනීම සඳහා ගෙන එය ලද බවට නිලධාරීන් විසින් ප්‍රකාශ කරන ලද බවත් සඳහන් කර ඇත.

බී.එල් නන්දාවතී යන අය විසින් කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, තම පුතා වන හක්මනගේ චන්දන කුමාර යන අය 2014.03.03 වන දින රාත්‍රි 7.00 ය පමණ පො.සැ 31362 එල්.පී.කේ තිලකරත්න යන අය ප්‍රකාශයක් ලබා ගැනීමට යැයි පවසා රැගෙන ගිය බවත්, දින 2ක් යනතුරු ඔහුව බැලීමට අවස්ථාව ලබා නොදුන් බවත්ය.

පී.එම් අමරනාත් රූපසිංහ යන අය විසින් ද ප්‍රකාශයක් ලබා දී ඇති අතර, ඉන් සඳහන් කර ඇත්තේ තම මිතුරෙකු වන හක්මනගේ චන්දන කුමාර යන අය 2014.03.03 වන දින රාත්‍රි 7.00ට පමණ ප්‍රකාශ ලබා ගැනීමට යැයි පවසා පො.සැ 31362 තිලකරත්න, සැරයන් ගුණරත්න හා තවත් අයෙකු පැමිණ චන්දන කුමාර යන අයගේ නිවස ඉදිරිපිට දී යතුරු පැදියක නංවාගෙන රැගෙන ගිය බවයි.

එච්.පී සිරිසෝම යන අය විසින් ලබා දී ඇති ප්‍රකාශයෙන් දක්වා ඇත්තේ, තම පුතු වන හක්මනගේ චන්දන කුමාර 2014.03.03 වන දින රාත්‍රි 7.00ට පමණ ප්‍රකාශ ලබා ගැනීමට යැයි දන්වා පො.සැ 31362 තිලකරත්න, සැරයන් ගුණරත්න හා තවත් අයෙකු පැමිණ යතුරු පැදියක නංවාගෙන රැගෙන ගිය බවයි.

එච්. සජිත් මධුශංක යන අය විසින්ද සඳහන් කර ඇත්තේ, තම සහෝදරයා වන චන්දන කුමාර යන අයව 2014.03.03 වන දින රාත්‍රී 7.00 ට පමණ ප්‍රකාශයක් ලබා ගැනීමට යැයි දන්වා පො.සැ 31362 තිලකරත්න, සැරයන් ගුණරත්න හා තවත් අයකු පැමිණ ඔහුගේ නිවස ඉදිරිපිටදී යතුරු පැදියක නංවාගෙන රැගෙන ගිය බවයි.

ශසිකා මධුරංගි යන අය ඇතුළු තවත් 07 දෙනකු විසින් ද අත්සන් යොදමින් 2014.03.03 වන දින අජිත් ගුණසේකර යන අය ඉඟිනියාගල පොලිස් ස්ථානයේ රඳවා සිටි බවට සඳහන් කරමින් ලේඛනයක් ඉදිරිපත් කර ඇත.

විමර්ශනයේදී අනාවරණය වී ඇති කරුණු :-

ඉඟිනියාගල පොලිස් ස්ථානයේ බල අපරාධ සටහන් පොතේ පිටු අංක 331 ඡේද 102 යටතේ 2014.03.05 වන දින පැය 18.25 ට යොදා ඇති සටහන් අනුව ඩී.වී අජිත් ගුණසේකර යන අයව 18.40 ට සහ හක්මනගේ චන්ද කුමාර, යන අයව පැය 18.55 ට උ.පො.ප සුමනරත්න, පො.සැ 12682, පො.සැ 28196, පො.කො 43635, සහ පො.කො 43155 යන නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇති බවට සටහන් කර ඇති බව අනාවරණය වී ඇත.

එසේම ඉඟිනියාගල පොලිස් ස්ථානයේ බල අපරාධ සටහන් පොතේ පිටු අංක 331 හි ඡේදය 103 අනුව 2014.03.05 දින පැය 19.10 ට උ.පො.ප සුමනරත්න, පො.සැ 12882 ගුණවර්ධන හා පො.සැ 25196 පතිරණ නිලධාරීන් බල අපරාධ 06/2014, 08/2014 ට අදාළ සැකකරුවන් පිළිබඳව ලද තොරතුරක් පරික්ෂා කිරීම සඳහා ඉඟිනියාගල බලාගාරය ප්‍රාදේශයේ සංචාරයකට ගොස් ඇති බවට සටහන් යොදා ඇත.

නමුත් පැමිණිලි පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති සාක්ෂි අනුව ඩී.වී අජිත් ගුණසේකර 2014.03.03 වන දින ප.ව 2.30 ට ඉඟිනියාගල පන්සල අසලදී පතිරණ හා තවත් නිලධාරියෙකු විසිනුත්, හක්මනගේ චන්දන කුමාර යන අය ඔහුගේ නිවසේදී පො.සැ 31362 තිලකරත්න, සැරයන් ගුණරත්න සහ තවත් අයකු විසිනුත් රාත්‍රී 7.00 ට පමණ අත්අඩංගුවට ගෙන ඇති බව අනාවරණය වී ඇත.

නමුත් 2014.03.05 වන දින ප.ව 12.45 ත් 1.00 ත් අතර කාලයේදී අම්පාර මානව හිමිකම් කොමිෂන් සභාව වෙත දුරකථන ඇමතුමක් ලබා දෙමින් සැකකරුවන් තමා භාරයේ සිටින බවට ස්ථානාධිපති, ඉඟිනියාගල විසින් ප්‍රකාශ කර ඇති අතර, ඉඟිනියාගල පොලිස් ස්ථානයේ බලඅපරාධ සටහන් පොතේ ඉහත දක්වා ඇති එම ප්‍රකාශයද, අත්අඩංගුවට ගැනීම සම්බන්ධව යොදා ඇති සටහන්ද, පරස්පර වන බවට නිරික්ෂණය වේ.

පැමිණිලිකරුවන් 2014.03.06 වන දින අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති බවද ලේඛන අනුව අනාවරණය වේ. පැමිණිල්ලේ සාක්ෂි අනුව පැමිණිලිකරුවන් 2014.03.03 වන දින සිට 2014.03.06 දින දක්වා නීතියේ නිසි ක්‍රියාදාමයට පටහැනිව ඉඟිනියාගල පොලිස් අත්අඩංගුවේ සිට ඇති බව අනාවරණය වේ.

අධිකරණ වෛද්‍ය පෝරම 2014/49, 2014/50 අනුව හා අම්පාර මහ රෝහලෙන් ලබා දී ඇති වෛද්‍ය වාර්තා අනුව පැමිණිලිකරුවන් හට බරපතල නොවන තුවාල සිදුව ඇති බවටද දක්වා ඇත.

එසේම සැකකරුවන්ගේ ප්‍රකාශ සටහන් කර ගැනීම 2014.03.05 දින වේලාව 18.25 පිටුව 331 ඡේදය 102 අනුව බව දක්වා ඇති අතර, එය එම සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට පෙර බවද නිරීක්ෂණය වේ.

ඉගිනියාගල පොලිස් ස්ථානයේ බල අපරාධ සටහන් පොතෙහි පිටු අංක 338 ඡේද 109 හි සටහන් අනුව සැකකරුවන් අත්අඩංගුවට ගැනිමේදී පලා යාමට තැත් කළ බවට සටහන් යොදා ඇති බවද අනාවරණය වේ.

**නිගමනය :-**

ඉහත සියළු කරුණු අනුව වගඋත්තර පාර්ශවය අදාළ සැකකරුවන් අත්අඩංගුවට ගැනීම 2014.03.05 වන දින සිදුවූ බවට කරුණු තහවුරු කිරීමට උත්සහ කර ඇතත්, පැමිණිල්ල ඉදිරිපත් කර ඇති සාක්ෂි අනුව පැමිණිලිකරුවන් 2014.03.03 වන දින අත්අඩංගුවට ගෙන 2014.03.06 වන දින දක්වා නීති විරෝධී ලෙස පොලිස් අත්අඩංගුවේ රඳවා තබාගෙන ඇති බව හා වෛද්‍ය සාක්ෂි අනුව හා පැමිණිලිකරුවන් ප්‍රකාශ කරන ආකාරයට වධහිංසාවට ලක්කර ඇති බවට අනාවරණය වී ඇත.

ඒ අනුව වගඋත්තර පාර්ශවයේ ක්‍රියාකලාපය හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව සහ 13(1) හා (2) වන ව්‍යවස්ථාව මඟින් සහතික කොට ආරක්ෂා කර දී ඇති පැමිණිලිකරුවන් සතු මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට පරීක්ෂණයෙන් අනතුරුව නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව සහ 13(1) හා (2) වන ව්‍යවස්ථාව මඟින් තහවුරු කර ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බැවින්, මෙම නිර්දේශයෙහි පිටපතක් පොලිස්පති වෙත යොමුකරනු ලබන අතර, අදාළ වගඋත්තරකරුවන් සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගැනීමට කටයුතු කළ යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2023. 04 .28 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

මා.හේ නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :

01. අමාත්‍යතුමා,
මහජන ආරක්ෂක අමාත්‍යාංශය,
14 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

02. පොලිස්පතිතුමා,
පොලිස් මූලස්ථානය,
කොළඹ.

03. අධ්‍යක්ෂ (මානව හිමිකම් කොට්ඨාශය) - අදාළ නිලධාරීන්ගේ නව සේවා ස්ථාන වෙත නිර්දේශය යොමු කිරීමට
අංක : 07, 7 වන මහල,
එන්.එම්.පෙරේරා මාවත,
කොළඹ 08.

03. මානව හිමිකම් කොමිෂන් සභාව ප්‍රාදේශීය කාර්යාලය,
අම්පාර.

B/